# ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - කොළඹ
# බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය,

# ලංසු කැඳවීමේ ආරාධනය

කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරුගේ ප්‍රසම්පාදන කමිටුව විසින් පහත විස්තර කොට ඇති ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා යෝග්‍යතා සම්පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ව්‍යාපෘතියේ නම | වැට් රහිත ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය ( සෘජු ඉදිකිරීම් සඳහා පිරිවැය) (රු) | ආකෘති පත්‍ර ගාස්තු (ආපසු නොගෙවන) (රු) | ලංසු ඇපකර මුදල ආපසු ගෙවන (රු) (මුදලින්) | කොන්ත්‍රාත් කාලය (දින) | අවශ්‍ය අවම CIDA ලියාපදිංචිය |
|---|---|---|---|---|---|
| **01. කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ පිහිටි ග්‍රීන් පාත් ප්‍රධාන ගොඩනැගිල්ල ගුරු සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.** | **17,300,000.00** | **4000/=** | **200,000/=** | **210** | **C 06** |

01. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සාර්ථක ලංසුකරු අසාදු ලේඛන ගත නොවී තිබිය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.
    පහත සඳහන් ආකාරයේ CIDA ලියාපදිංචිය තිබිය යුතුයි.
    **විශේෂිතතාවය** : ගොඩනැගිලි
    **ශ්‍රේණිය** : ඉහත උපලේඛනයේ සඳහන් ශ්‍රේණියේ හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය.
    **බස්නාහිර පළාත තුල ව්‍යාපාර නාම ලියාපදිංචිය අනිවාර්ය වේ**.

02. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි අතර කාර්යාල වේලාව තුලදී කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේදී ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

03. අදාල ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ( උප ලේඛනයේ සඳහන් ආකාරයෙන්) **2020.12.07** දින සිට **2020.12.18** දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව 9.00 හා ප.ව 03.00 අතර කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ගෙවීමෙන් අනතුරුව ප්‍රාදේශිය ඉංජිනේරු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලංසුකරු හෝ ඔහුගේ/ ඇයගේ බලයලත් නියෝජිත හට ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබාගත හැකිය.

04. මුල් පිටපත හා අනු පිටපතකින් යුත් ලංසු **2020.12.21** පෙ.ව **11.00** ට හෝ ඊට පෙර ලැබෙන පරිදි කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී **2020.12.21** දින පෙ.ව **11.10** ට ලංසු විවෘත කරනු ලැබේ.

05. සියලුම ලංසු සමඟ (ඉහත උපලේඛනයේ සඳහන් පරිදි) ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුව ගෙවූ බවට ලද රිසිට් පත/ ලංසු සුරක්ෂණය අමුණා එවිය යුතුයි.

06. පෙර ලංසු කැඳවීමේ රැස්වීම 2020.12.15 දින පෙ.ව 10.00 ට නො.76, ආනන්ද කුමාරස්වාමි මාවතේ පිහිටි ග්‍රීන්පාත් ගොඩනැගිල්ලේදී පැවැත්වේ.

**පී.ඩී.ආර්. නදීරා**
**සභාපති, කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරුගේ ප්‍රසම්පාදන කමිටුව,**
**අංක 151/4 - 2/1, ජයතිලක පෙදෙස,මාළිගාවත්ත,කොළඹ 10.**
**දුරකථන අංක : 0112-447773**
**ෆැක්ස් අංක : 0112-337873**